ඇබෑර්තු

ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

වාණිජ කෘෂිකර්ම සංවර්ධන (Commercial Agriculture Development - CAD) වැඩසටහන

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP) - අදියර II

(ව්‍යාපෘති කාලය - 2026 - 2031)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP) - අදියර II යටතේ අනුරාධපුරයේ ක්‍රියාත්මක කරනු ලබන වාණිජ කෘෂිකර්ම සංවර්ධන (Commercial Agriculture Development - CAD) වැඩසටහන (අනුරාධපුර) සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2026.03.28 දිනැති අංක 02/2026 දරන චක්‍රලේඛය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 සහ රජයේ බඳවා ගැනීමේ පටිපාටි අනුව පහත සඳහන් තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම පිණිස සුදුසුකම්ලත්, කැපවීම සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම වැඩසටහනේ සමස්ත පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 536.5 ක් වන අතර, ඒ සඳහා දේශීය අරමුදල් ද දායක වේ.

තනතුරු සඳහා වැටුප් ගෙවීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 02/2026 චක්‍රලේඛයේ උපලේඛන අංක 02 සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව සිදු කරනු ලැබේ.

පුරප්පාඩු - වාණිජ කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන

අනු අංකය	විස්තරය	වැටුප් කේතය	තනතුරු සංඛ්‍යාව
1	ග්‍රාමීය ණය විශේෂඥ	කාණ්ඩය C	01
2	සිවිල් ඉංජිනේරු විශේෂඥ		01
3	ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව, තරුණ කටයුතු, පැමිණිලි විසඳීමේ යාන්ත්‍රණය (GRM) සහ සමාජ ආරක්ෂණ නිලධාරී	කාණ්ඩය E	01
4	පුහුණු නිලධාරී		01
5	සත්ත්වවේදන නිලධාරී		01
6	පාරිසරික නිලධාරී		01
7	අධීක්ෂණ හා ඇගයීම් නිලධාරී		01

පුරප්පාඩු - මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (දෙවන අදියර ව්‍යාපෘතිය)

අංකය	තනතුර	වැටුප් මට්ටම	සේවා ස්ථානය	තනතුරු ගණන
1	රියදුරු	PL - 3	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය - මඩාටුගම	01
			ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය - මොරගහකන්ද	02

අදාළ චක්‍රලේඛ

කාණ්ඩය C සිට කාණ්ඩය E දක්වා තනතුරු සඳහා

- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2026.03.28 දිනැති අංක 02/2026 දරන චක්‍රලේඛය.
- සහාය කාර්ය මණ්ඩලය සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2026 අදාළ වේ. (සහාය කාර්ය මණ්ඩල තනතුරු සඳහා බඳවා ගැනීමේදී රජයේ බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටි සලකා බලනු ලැබේ.)

✷ අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 64 ට අඩු විය යුතුය. ඉංග්‍රීසි භාෂා දැනුම, රජයේ රෙගුලාසි පිළිබඳ අවබෝධය සහ පරිගණක දැනුම අත්‍යවශ්‍ය සුදුසුකම් වේ. ශ්‍රී ලංකාවේ විදේශ ආධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘතිවල සේවා පළපුරුද්දක් තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ. දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

වැඩිදුර විස්තර www.mwsip.lk/careers වෙබ් අඩවියෙන් ලබාගත හැකිය. අදාළ චක්‍රලේඛ මුදල් අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් ද පරිශීලනය කළ හැකිය.

එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් සකස් කර 2026/12/04 දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් පහත ලිපිනයට ලැබෙන පරිදි යොමු කළ යුතු අතර, අයදුම් කරන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

ව්‍යාපෘති අධ්‍යක්ෂ,
මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP) - අදියර II
(මානව සම්පත් අංශය)
අංක 493/1/1, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

කෙටි ලැයිස්තුවට ඇතුළත් වන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. කිසිදු ආකාරයක බලපෑම් කිරීම (Canvassing) නුසුදුසුකමක් වන අතර, එවැනි අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ව්‍යාපෘති අධ්‍යක්ෂ,
මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP) - අදියර II ව්‍යාපෘතිය.